ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2012 ජුනි 21 |

## ශ්‍රී ලංකා රජයේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව - 2012

ශ්‍රී ලංකා රජය වෙනුවෙන්, එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 1,000 දක්වා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයක් සුදුසු කල්පිරීමේ කාලයක් සහිතව ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොලට නිකුත් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සැලසුම් කරමින් සිටී.

මේ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලැබුණු යෝජනා අටක් ඇගැයීමෙන් අනතුරුව, මෙම ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව පිළිබඳ ඒකාබද්ධ නියමු කළමනාකරුවන් (Joint Lead Managers), ගනුදෙනු පවත්වා ගන්නන් (Bookrunners) සහ ප්‍රතිරක්ෂකයන් (Underwriters) ලෙස කටයුතු කිරීම පිණිස බැන්ක් ඔෆ් ඇමෙරිකා මෙරිල්ලින්ච්, බාක්ලේස් කැපිටල්, සිටි බැන්ක් එන් ඒ සහ ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් යන ජාත්‍යන්තර ආයෝජන බැංකු හතර පත් කර ඇත.

මීට අමතරව, මෙම යෝජිත බැඳුම්කර නිකුතුව සම්බන්ධ කටයුතු සඳහා ඒකාබද්ධ නියමු කළමනාකරුවන් හතර දෙනා සමග සම කළමනාකරුවකු ලෙස කටයුතු කිරීම සඳහා මහජන බැංකුව තෝරාගෙන ඇත.